# දේශපාලන නායකයන් සහ අලුත් පක්ෂ සාදන්නනි, ඔබලා ට ඓතිහාසික කාර්යභාරයක් පැවරී නැත.

## ප්‍රගීත් එක්නැලිගොඩගේ කතිකාවකි

(ලංකා ඊ නිව්ස්-2008 මැයි 13, ප.ව. 2.15) ජ.වි.පෙ. නායකයනුත්, තවත් අයත් මැයි දින සැමරුම් රැලිවලදී, තම තමන්ට කිරීමට ඓතිහාසික කාර්යභාරයක් පැවරී ඇතැයි පැවසූහ. දින කිහිපයකට පෙර අලුත් පක්ෂයක් ගොඩනැගීමට සිත් වී විමල් වීරවංශ මහතාත් තමන්ට ද පැවරී ඇති ඓතිහාසික කාර්ය භාරය ගැන සිහිපත් කළේය. එක එක කාලයට ලංකාවේ කොයි කොයි දේශපාලන නායකයනුත් ඒ ඒ නායකයන්ට උපදෙස් දෙනවායැයි කියන අයත් තම තමන්ගේ පක්ෂවලට ඉටු කිරීමට ඓතිහාසික කාර්යභාරයක් පැවරී ඇතැයි කියා කියති. මේ විටින් විට කියන කියමන, කොතෙක් වතාවක් නම් අප අසා ඇත්ද? 1948 සිට මේ වචනය ඇසීමෙන් ම අපගේ කන් දෙක ගොඩ නොවී තිබීම පුදුමයක් ම තමයි. එහෙත් ඒ අයගේ ඒ ඓතිහාසික කාර්යභාරය තවමත් අවසන් වූ පාටක් නම් පෙනෙන්නට නැත. ගිහියන් මදිවාට දැන් පැවිද්දෝ කණ්ඩායමක් ද මේ කාරියට එක්ව සිටිති. අලි මදිවාට හරක්?

සාධාරණව දුක බෙදීම

කුමක්ද, මේ අයට පැවරී ඇතැයි කියන මේ ඓතිහාසික කාර්යභාරය? අතීතයේ ඉඳන් පිළිවෙළට බලන කොට එය දිග ලැයිස්තුවකි. ඉංගිරිසි බස නැතිකිරීම හා දෙමළ බස ඉවතට තල්ලුකර දැමීම, දේශපාලන විරුද්ධවාදීන්ගේ ව්‍යවසායයන් රජයට පවරාගැනීම හා ව්‍යවසාය කටයුතු ආණ්ඩුව භාර ගැනීම, විදේශීය ව්‍යවසායයන් පලවා හැරීම හා අධිරාජ්‍යවාදය පරාජය කිරීම, සිංහළ බෞද්ධ ව්‍යවස්ථාව හදාගැනීම හා කුඩා ජනවර්ග මට්ටුකිරීම, ඒකීය සිංහල රාජ්‍යය පිහිටුවා ගැනීම හා භෞමික අඛණ්ඩතාවය රැක ගැනීම.......සහ තවත් දේවල් පසුවට. මීට සමාන්තරව ඒ පිළිවෙලටම දිගට දිගේ ප්‍රතිඵල ලැයිස්තුවක් ද තිබේ. එය මෙසේය. ශ්‍රී ලාංකික දරුවන්ගේ දැනුම බොන්සායිවීම හා මන්දබුද්ධිපෝෂණය වර්ධනයවීම, දේශීය ව්‍යවසායකයා සරණාගතයෙකු වීම හා ජාතික ආර්ථිකය කොර වීම, ජාත්‍යන්තර ව්‍යවසායකත්ව ආරෝපනය අතුරුදන් වීම හා රාජ්‍ය ව්‍යවසාය නමැති බහිරවයන් බිහිවීම, කුඩා ජනවර්ග අමනාපවීම හා රජයට එරෙහි වාර්ගික සන්නද්ධ කැරලි හටගැනීම, වාර්ගික සිවිල් යුද්ධයක් හටගැනීම හා භෞමික අඛණ්ඩතාවය රැකගැනීම කියා අලුත් අභියෝගයක් පැන නැගීම, රට කාලකණ්ණි වීම හා ලෝකයා ඉදිරියේ බාල්දුවට ලක්වීම හැරුණු විට තව බොහෝ අභාග්‍යයන් අනාගතයට.

මාතෘ භූමියට හූනියම් කරන්න එපා

මේ ඓතිහාසික කාර්යභාරය අපට ඇහෙන හැටියට නම් දෙයාකාරයකි. එක කොටසක් සිංහළ ජාතිය යටතේ ඒකීය රාජ්‍යයක් පිහිටුවීම තමන්ට ඉතිහාසයෙන් පැවැරී ඇතැයි කියා සිටිති. ඒ කවුරුත් දෙනා දැන් රාජපක්ෂ

මහතාගේ කක්ෂයෙහි ධාවනය වෙමින් සිටිති. ඊට පෙර දශක ගණනක් තිස්සේ ඔවුහු වෙනත් වෙනත් කක්ෂ වටා ධාවනය වෙමින් සිටියහ. ඒ උදවියගේ අදහස බොහෝම සරලය. දෙමළුන්ටත් මුස්ලිමුන්ටත් මේ රටේ අයිතියක් නැති බව තේරුම්කර දී, කැමතිනම් සිංහල රාජ්‍ය යටතේ ජීවත් වන්න පුරුදු වන්නැයි කියා, එය පිළිගන්නවුන් ට වීසා ලබා දී, පිළි නොගන්නවුන් පරලොව යවා, නියම ජේනුයින් සිංහල පාට්ස් යොදා රාජ්‍යයක් ගොඩ නැගීම එම අදහසයි. 19 වන සියවසේ සිට නගරබද සිංහල සාප්පුකාරයන්ගේ චින්තනයෙන් උපත ලැබූ මෙම 'ඓතිහාසික කාර්යභාරය', පාදඩ සමාජය ලවා කිහිප වතාවක් ම ක්‍රියාත්මක කරන්නට ගොස්, ජාතියේ ඉතිහාසය කැළැල් කොට, පසුව බොදු මඟ වැරදුනු ගිහියන් හා පැවිද්දන් ද ඊට යා කර ගෙන, තව තවත් සමාජ කිලුටු එකතු කරගනිමින්, අද රාජ්‍ය බලයද ඇතිව වල්ගා තරුවක් සේ පායා තිබේ. ශතවර්ෂයක වේලේ ඉඳන් සිදාදියේ කඩ කාර වඳුරන් බළල් අත් සොයමින් සිටියේ, මේ ඓතිහාසික කොස් ඇට බෑමේ කාර්යභාරය කිරීමටය. ජාතික හෙළ උරුමයේ ඇත්තන් නම් කියන්නේ මෙය ජාතික හෙළ උරුමය කියාදෙන තෙක්ම, ඒ ගැන මෙලෝ සංසාරයක අවබෝධයක් කාටවත් තිබුනේ නැති බවය. එල්. එච්. මෙත්තානන්ද කේ.එන්. ජයතිලක යන වියතුන් මෙන්ම, කේ.එම්.පී. රාජරත්න, සී. සිරිල් මැතිව් යන දේශපාලනඥයන් ද ජීවත්ව සිටියානම්, ඒ කතාව අසා ඒ ඇත්තන්ට කුමක් සිතෙනු ඇත්ද? දෙමළුන්ගේ රට ඉන්දියාවද, මුස්ලිම් මිනිසුන්ගේ රට අරාබිය ද යැයි එල්ලාවල හාමුදුරුවන් කියන විට සිරිල් මැතිව් මහතා ඒ කාරණය ගැන කිව්වේ මෙසේය.''කලාපීය වශයෙන් ගත් කල සිංහල ජනතාව සුළුතරයකි. ඔවුන්ට ලංකාව හැරෙන්නට වෙන රටක් නැත. ලංකාවේ වාසය කරන අනෙකුත් ජනවාර්ගිකයන්ට වෙනත් රටවල්, ජනවාර්ගික සම්බන්ධතා හා අවශ්‍යතා ඇත.'' දෙවැනි ආකාරය ආරම්භ වී ඇති බවට පොසිල සාක්ෂි හමුවන්නේ පිලිප් ගුණවර්ධන සොයුරාණන්ගේ සොහොන් කොත් අතරිනි. ඒ හඬ අදට කරලියට ගෙන එන, ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ රාජපක්ෂ මහතාට ඒකීය රාජ්‍ය ගොඩනැගීම හරියට කරගන්නට බැරි බවත්, එය කළ හැකි නියම සුදුස්සා තමන් බවත්ය. පිලිප් සහෝදරයාද ඒ කාලේ අනෙක් අය ගැන කියා සිටියේ ඕකමය. ඒත් තමන්ගේ ඔරිජිනල් අදහසක් කියා කියන ජ.වි.පෙ. කියන්නේ ඒ කාර්යය හරියටම කරන්නට නම්, පෞද්ගලික දේපොළ ක්‍රමය මිහි මතින් දුරුකළ යුතු බවය. ඉන්පසු සමාජවාදී ක්‍රමයක් හෙවත් දැනට ලෝක යථාර්ථයේ ඇති හැටියට කියනවානම්, රාජ්‍ය කේන්ද්‍රීය දේපොල ක්‍රමයක් ගොඩනැගිය යුතුය. ඉන්පසු ව හෝ ඒ එක්කම ත්‍රස්තවාදය මැඩලා ජාතීන් අතර සමානත්මතාවය ඇති කොට අර ඒකීය රාජ්‍ය පිහිටුවිය යුතුය. එය තරමක් දුරට ශ්‍රේෂ්ට ලෙනින්ගේ හා ශ්‍රේෂ්ට සිරිල් මැතිව්තුමාගේ දර්ශන නියම අනුපාතයට කලවම්කොට දර්ශනීය ලෙස ඉදිරිපත් කිරීමකි. හරියට 'ගොළු රූමතිය' මෙන් ශාපලත් රසඳුනකි. මේ කොයිහැටි වෙතත් දෙගොල්ලම කියන්නේ තවමත් තමන්ට අර 'ඓතිහාසික කාර්යභාරය' හරියට කර ගන්නට බැරි වූ බවය. ඉතින් තව තවත් ඒ අයගේ සේවාකාලය දිගු කරගන්නට මාන බලති. දැන් අප ඉන්නේ අතීතයේ දී රම්‍ය දිවයිනක්ව තිබී අවුරුදු 60 ක් තිස්සේ ඔය කියන ඓතිහාසික කාර්යභාර ඉෂ්ට

කරන්නට ගොස් සුන් බුන් ගොඩක් බවට පත්කළ පාළු මුඩුබිමකය. එ හෙත් මේ අපේ රටය. මේ අපේ දූපතය. පසුගිය නිදහස් දා රාජපක්ෂ ජනාධිපතිවරයා ජාතියට කියා සිටියේ ඒ ලජ්ජා සහගත අමන අතීතය සිහිපත් කිරීම රටට කරන ද්‍රෝහිකමක් යයි කියාය. නමුත් රටට කරන විශාලම ද්‍රෝහිකම නම් අපට වෙච්ච වැරැද්ද නො සොයා නො බලා වෙන දෙයක් වෙන්නට ඉඩහැර සිටීම ය. එසේ සිටින තාක් කල් පඹගාලෙන් එලියට ඒමක් නැත. රාජපක්ෂ මහතා හෝ තවත් 'කරේ අළු ඇති අය' බියවිය යුතු නැත. සිදු වූ වැරදි සොයා බැලිය යුත්තේ 'ද්‍රෝහීන්ට' දඬුවම්දීමට නොව අනාගතය රැක ගැනීමටය. 1815 සිට වසර 133 ක් ඉංග්‍රීසි පාලකයන් මේ රට පාලනය කළේ ඒකීය රාජ්‍යයක් හැටියටය. 1948 දී ලංකාව ස්වදේශික නායකත්වයකට භාර දුන්නේත් ඒකීය රාජ්‍යයක් වශයෙනි. එය සිංහලුන්ගේත් දෙමලුන්ගේත් මුස්ලිමුන්ගේත් තව තවත් කුඩා ජනවර්ගවලත් එකමුතුවෙන් තහවුරු කරගැනීම, එදා සිට පැවරුණේ ස්වදේශික නායකත්වයටය. එයිනුත් ජන ගහනයෙන් වැඩි බහුතරය වූ සිංහල ජනසමූහයටය. එය හරියට කර ගත්තානම් අර කියන ඊනියා ඓතිහාසික කාර්යභාරය කරන්නට වුවමනා වන්නේ ද නැත. එ හෙත් ඒ වගකීම ඉටුකරන්නට බැරිවීම ගැන මෙරට පාලනය කළ-නොකළ දේශපාලන පක්ෂ වග කිව යුතුය. එ මෙන්ම ප්‍රාථමික ජන සමාජයේ සිතන මතන පිළිවෙළ තනන, දැන උගත් ද්විතියික ( වර්ධිත ) සමාජයට ද ඒ වගකීමෙන් මිදෙන්නට පුළුවන්කමක් නැත. 1948 න් පසු විසඳා ගැනීමට තිබූ පළමු ප්‍රශ්ණය වූයේ සාර්ථක රාජ්‍යයක් තහවුරු කරගැනීමය. එ හෙත් ලංකාවේ දේශපාලන සමාජයත් බුද්ධිමය සමාජයත් තවම ඉන්නේ ඒ පළමු ප්‍රශ්ණයටවත් උත්තරය ලියාගන්න බැරිවය. ඔවුන්ට සාර්ථකව කළහැකි එකම දෙය ලෙස පෙනෙන්නේ, වරින් වර ප්‍රාථමික ජන සමාජය අතරට කඩා වැදී, වර්ග වෛරයෙන් ඒ ජනගහනය බෙදා එකිනෙකා කොටා ගන්නට සැලැස්වීම පමණි. එ මගින් තමන් නගා සිටුවනවාය කියා කියන සිංහල ජාතියත් පරිහානියට පත්කිරීමය. තමන්ගේ බැරිකම නිසා, ඓතිහාසික කාර්යභාරයක් ඉෂ්ට කරන්න තියෙනවාය කිය කියා අවුරුදු හැටක්, එනම් සක්‍රීය මිනිස් ජීවිත කාල දෙකක්, මේ ජෝං බාස්ලා වනසා තිබේ. ඔවුන් වැනසුවේ ළමයින්ගේ ළමා කාලයය. තරුණ-තරුණියන්ගේ වටිනා තරුණ කාලයය. මානව දැනුම එන මාර්ගයන් ය. මුළු ජන සමාජයේම වටිනා ශිෂ්ටාචාර කාලය ය. රටක් ගොඩ නගන්නට තිබූ වටිනා කාලය හා අවකාශයන් ය. මිනිස් ශිෂ්ටාචාරය අතිමහත් ජයග්‍රහන රැසක්ම අත් පත් කර ගත්තේ ත් අසල්වැසි රටවල් අප පසුකර ඉදිරියට ගියේ ත්, අපට වැරදුනේ ත් පසුගිය වසර 50 දී ය. ජපානයට පසුව ආසියාවේ සාක්ෂරතාවය සපුරා ගත් ප්‍රථම රට වශයෙන්, දකුණු ආසියාවේ අධ්‍යාපන කේන්ද්‍රය බවට පත් වීමට මේ රටට තිබූ අවස්ථාව, කුඩා ජනවර්ගවලට කොටන්නට ගොස් අහිමි කළේ මේ අයයි. අද ඒ අවස්ථාව හිමිකරගෙන සිටින්නේ සිංගප්පූරුවයි. හෙළ උරුමයේ ගිහි පැවිදි ඇත්තන් සමග රාජපක්ෂ මහතා, අපට අමතක කරන්නැයි කියා කියන්නේ ඒ දේශපාලන පරපුර කළ හා කරමින් සිටින මහා ජාතික අපරාධයයි. කළ හරිය මදිවාට ඔවුහු තවම වැඩ ඉවර නැතැයි කියමින් තවත් රටේ ඉරණම අඳුරු කිරීමට වේලාව ඉල්ලා සිටීම පුදුම සහගතය. කෙනෙකු මිනිස් ආත්ම භවයක් ලබන්නේ ජාති

ජාති පෙරුම්පුරා, පෙර පිනක් තිබුනෝතින් පමණක් යැයි කියා බෞද්ධයෝ විශ්වාස කරති. හින්දු භක්තිකයෝද මිනිස් භවය උතුම් කොට සලකන්නේ මරණින් මතු මෝක්ෂ්‍යගතවීමට පින් උපයා ගත හැක්කේ මිනිස් භවයේදී පමණක් ය කියා විශ්වාස කරන නිසා ය. මැවුම්කාර දෙවියන් වහන්සේගේ විශිෂ්ටතම නිර්මාණය මිනිසා යැයි කියා කිතුනුවෝ ද මොහම්මදිකයෝ ද විශ්වාස කරති. ඉතින් දහම් සිසිලෙන් නැහැවෙන නායකයන් එවන් උතුම් මිනිස් භවයක් ලැබූ ජන සමාජයකට එලොවදී තබා මෙලොවදීවත් ජීවිතයේ ජීවන සුවය විඳීමට ඉඩ නොදෙන්නේ මන්ද? රට දැය සමය වෙනුවෙන් දිවි දෙන්නට සූදානම් සමාජයක්, සියයට අනූඅටක සාක්ෂරතාවයක් ඇති සමාජයක්, තම රටේ ඉරණම දේශපාලන ඉච්චාකාරයන්ට අඳුරු කරන්නට ඉඩ දී මෙතරම් පහසුවෙන් ඉවසා සිටින්නේ කෙසේද? මේ රට දූපතක් නොවී මහාද්වීපයක කොටසක් වූයේ නම්, ඇතැම් විට අපේ ඉරණම මීට වෙනස් වන්නට ඉඩ තිබිණ. සමාජවාදී ක්‍රමයක් මගින් සියල්ල ජයගැනීමට සිතන අයට ද තමන් ඒ කරන්නට යන දේ ගැන හරිහමන් වැටහීමක් හෝ ලෝක අත්දැකීම් ගැන ප්‍රමාණවත් අවබෝධයක් ඇත්දැයි සැක සහිතය. මන්ද? එහි යථා තත්ත්වය දන්නවානම් අද කාලයේ ඒ ක්‍රමය වෙනුවෙන් කෙනෙකු කතා කරන්නේවත් නැත. සමාජවාදය ගොඩනැගීම වෙනුවෙන් වෙහෙසුන විශාල දේශපාලන ව්‍යාපාරයක් ඈත අතීතයේ දී දකින්නට ලැබුනත්, අද එ වැනි ව්‍යාපාරයක් මෙ රට ඇත්තේ නැත. ලෝකයේත් නැත. කම්කරු පාලනයක් ලෝකයේ කොහේවත් ඇතිවූයේද නැත. චේතනාව යහපත් වුනත් මිහිමත පැවැති සමාජවාදී උත්සාහයන් සියල්ලම අසාර්ථක විය.

එසේ වූයේ සමාජවාදී 'දේව සැලැස්ම' ස්වභාවික මනුෂ්‍ය ගතිකත්වයට පටහැනි වීම නිසාය. ඒවා ක්‍රියාත්මක කළේ අවංක ශ්‍රේෂ්ඨ මිනිසුන් බව ඇත්තය. එ හෙත් ඒ අවංක භාවය කැපවීම අර්ථවත් නොවී ය. නිවැරදි නොවී ය. විද්‍යාත්මක යැයි කීවත් සමාජවාදය විද්‍යාත්මක නොවී ය. මේ නිසා ඇමෙරිකන් කාරයන් කළ කුමන්ත්‍රණ නිසාම සමාජවාදයේ බිඳ වැටීම සිදුවුනා යැයි සිතීම මුග්ධකමකි. තම කැපවීම අවංකභාවය විනය ගරුකභාවය වැනි වියුක්ත ගතිගුණ ගැනම වැඩියෙන් කතාකරන ජ.වි.පෙ. වැනි සංවිධානවලට මෙය වැදගත් ය. උයනේ නිදා සිටි රජුගේ ගෙලෙහි වැසූ මැස්සාට මගුල් කඩුවෙන් කෙටූ හිතවත් වඳුරා ද අවංක ය. විශ්වාසය, කැපවීමෙන් යුක්ත ය. විනය ගරුක ය. එහෙත් මෝඩ ය. සමාජවාදයේ බිඳවැටීම කිසිසේත් අධිරාජ්‍යවාදයේ හෝ ධනවාදයේ ජයග්‍රහණයක් වන්නේ නැත. මන්ද කියනවානම් ඒ වන විට ධනවාදය මූලධර්මීය වශයෙන් මුලුමනින්ම දිය වී ගොස් වෙනස් වී, අලුත් හුවමාරු සම්බන්ධතා ක්‍රමයකට පරිණාමය වී තිබුනු නිසාය. විශාල ධනහිමියන් හා සමාගම් විසින් පාලනය කළ ලෝකයේ ප්‍රධාන කොටස් වෙළඳ පොලවල් 70 දශකය වනවිට වෙනස් වෙමින් තිබිනි. කම්කරු පංතියේ අරමුදල් හා රක්ෂණ අරමුදල් වැනි දශක ගනනාවක් තිස්සේ එක්රැස්ව තිබූ, සාමාන්‍ය මිනිසාගේ අති විශාල අරමුදල් කොටස් වෙළඳපොලවල ආයෝජනය කෙරීමෙන් පසු කොටස් වෙළෙඳපොල ජනතාකරණය වී තිබේ. ඒ අනුව සමාජවාදය බිඳවැටෙන විට ජාත්‍යන්තර නිර්ධන පංතියද මූලධර්මීය වශයෙන් එහි මුල් ස්වරූපයෙන් වෙනස්

වී සිටියහ. ඔවුහුද ප්‍රාග්ධන හිමියන් බවට පත් වී නිර්ධනයනුත් නොවන ධනපතියනුත් නොවන නවීන පාරිභෝගික සමාජයක් බවට පත්ව සිටියහ. ඉතින් තවදුරටත් ප්‍රතිසංස්කරණය කරගන්නට මිස විප්ලවයකින් පෙරලා දමන්නට තරම් ජාතියේ ධනපති ක්‍රමයක් ඒ රටවල තිබුනේ නැත. මේ නිසා පළමු ලෝකය හෙවත් සංවර්ධිත රටවලට ජනතාවට සමාජවාදී විකල්පයක් අවශ්‍යවී තිබුනේ නැත. සමාජවාදී සැපතට ඊර්ෂ්‍යා කරන්නට හේතුවක් ඔවුනට තිබුනේ නැත. කොටින්ම කියනවානම් සමාජයක් ආපස්සට පරිණාමය වන්නේ නැත. ලෝක ස්වභාව ධර්මයට අනුව මිනිසා යනු ලෞකික සැප කැමැති සත්වයෙකු බැවින් සමාජවාදයේ බිඳ වැටීම කුමණ්ත්‍රනයක් නොව යථාර්ථයකි. හියුගෝ චාවේස්ට හෝ නේපාලයේ ප්‍රචණ්ඩාට ඒ ඉරණම වෙනස් කළ නොහැකිය. ව්‍යවසායකත්වය යනු නිෂ්පාදන සාධකයක් නොව, සූරාකෑම වහගන්නට ධනපතියන් දෙසාබාන කෙබරයක් යැයි කියූ සමාජවාදීහු, ව්‍යවසායකත්වය කොමිසාර් සහෝදරවරුන් ට භාර දී යහපත් ප්‍රතිඵල එනතෙක් බලා සිටියහ. පොතේ හැටියටම ක්‍රියාකළත් සමාජවාදයේ ප්‍රතිඵල නපුරුවිය. කාර්යක්ෂමතාවය බිංදුවට බැස්සේය. දූෂණය වේගයෙන් ව්‍යාප්ත විය. සමාජ විරෝධය වලකා ශ්‍රේෂ්ඨ විප්ලවයේ උරුමය රැකගනුවස් විප්ලවීය පාලනය කුරිරු විය. එ හෙත් එය ස්ටාලින්ගේ වැරැද්ද, මාඕ ගේ වැරැද්ද, අරයගේ වැරැද්ද, මෙයාගේ
වැරැද්ද කිය කියා, කවුරු කවුරුත් සමාජවාදයට ඇති අන්ධ ආදරය නිසා, නියම ප්‍රශ්ණයෙන් මග හැරියා මිස සමාජවාදී ක්‍රමයේ වැරැද්ද තේරුම් නොගත්තෝය. තියුනු මාක්ස්වාදී බුද්ධිමතෙකු වූ අයිෂෙක් ඩොයිෂර් 1950 දශකයේදී පමණ (කොම්වෙල් දේශන) සමාජවාදී ක්‍රමයේ වැරැද්දක් ඇතැයි සැක කළේය. මුලු ලෝක සමාජවාදී ව්‍යාපාරයම ලංකාවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ තත්ත්වයට පත්විය. ඒ ඒ රටවල ජනතාවට, එය ඉමහත් පීඩාවක් විය. අවශේෂ ලෝක ජනතාව අත්පත් කරගත් ශිෂ්ටාචාර ජයග්‍රහණ අත් විඳින්නට ඔවුනට අවස්ථාව ලැබුනේ නැත. කරවිල ගෙඩියේ ඉපැදුන පනුවන් සේ ලෝකයට විවෘත නොවූ අඳුරක ජීවත් වීමට සමාජවාදී රටවල ජනසමාජයට සිදුවිය. සමාජවාදය යටතේ සැප කෙසේ වෙතත් දුකවත් සමානව බෙදී ගියේ නැති බව වරින් වර හෙලිදරව් වන තොරතුරු වලින් පැහැදිලිවේ. සියළුම වර්ගවල නිදහසේ මාතෘ නිදහස සමාජවාදය යැයි කීවත් අන්තිමේදී එය සියළුම වර්ගයේ නිදහස වලළා දැමෙන සිර මැදිරිය බවට පත්විය. එදිරිවීර සරච්චන්ද්‍ර, මාර්ටින් වික්‍රමසිංහ ආදී සමාජ පුරෝගාමීන් ඒ කාලේ සමාජවාදී රටවල ඇවිදිමින්, මහ ඉහලින් වර්ණනා කළත්, බර්ලින් තාප්පයත් පෙරලාගෙන ඒ රටවල ජනී ජනයා ජරා ධනවාදී සැපත සොයා ගියකල එතෙක් වැසී තිබූ සත්‍ය හෙලිවිය. ඇත්තෙන්ම ජෝජ් ඕවල් ගේ සත්ව ගොවිපල නම් නව කතාව සමාජවාදය ගැන කෙරෙන අසාධාරණ තක්සේරුවක් එහෙම නොවේ. එ හෙත් ලංකාවේදී සමාජවාදය යන අදහස අලෙවි කැරෙන්නේ කේරලයේදී මෙන් සමාජ සුබසාධනය යන අදහසත් සමඟ ගානට කලවම් කිරීමෙනි. ඒ නිසා ලෝකාවබෝධයක් නැති ප්‍රාථමික ජන සමාජය අතර ඊට ඉල්ලුමක් තවමත් ඇත. මේ නිසා බොහෝ උගතුන් පවා තමන් ප්‍රබුද්ධයෙකු වීමට යොදාගන්නේ ඒ සමාජවාදය පිලිබඳ සංකර ජනමතකයට ඇමතීමය. කොටින්ම කියනවානම්

තමන් සමාජවාදියෙකු ලෙස පෙනී සිටීමෙනි. එය ඔවුන්ගේ ආරක්ෂාවට හොඳය. ජනාධිපති ප්‍රේමදාස මහතා ගෙනගිය ජනසවිය නම් වූ ග්‍රාමීය සුබසාධන ව්‍යාපාරය සුසිල් සිරිවර්ධන මහතා එ කල හැඳින්වූයේ සමාජවාදී බලාපොරොත්තුවක් යම්තාක් දුරකට හෝ ඉටු වීමක් හැටියටය. එ මෙන්ම එ කල විපක්ෂයද ඒ ගැන කලබලයට පත් වූයේ එම සමාජවාදී වැඩසටහන නිසා තමන්ට යන එන මං නැති වේදෝයි යන චකිතයෙනි. ඔවුන් එසේ සිතීම වරදක් නොවේ. මන්ද? 70-77 දක්වා තමන්ට හරියට කරගන්නට බැරි වූ දෙයක් යූ එන් පී කාරයන් කිරීම ඔවුන් රිස්සු වේ නැත. 1970 සිට 1977 දක්වා මේ රටේ අත්හදා බැලුවේ ප්‍රායෝගික සමාජවාදය බවත්, අදත් කොහොමහරි රැක ගත යුතුයැයි කියා කියන පාඩු ලබන රාජ්‍ය සංස්ථා හා මණ්ඩල වනාහී, අර අසාර්ථක සමාජවාදී අත්හදා බැලීම්වල උරුමයන් බවත්, බොහෝ දෙනා අමතක කරති.

කොයිහැටි වෙතත් රට වර්ගාන්තර කා කොටා ගැනීමකට පත්කිරීමෙන් පසු ජන සමූහයන් අන්‍යොන්‍ය වශයෙන් එකිනෙකාට බියෙන් හා වෛරයෙන් ඇලලී පසුගිය දේශප්‍රේමයටත් අලුත් වෙළඳපොලක් ඇති වූ නිසා, අර 'සමාජවාදී රස කතාවට' ඊනියා දේශප්‍රේමයද එකතුකරගෙන තිබේ. දැන් ඉතින් ජනතා තාරකාවක් වන්නටනම් දේශප්‍රේමය අත්‍යාවශ්‍යය. සමාජවාදය සමග දේශප්‍රේමය ද කලවම්වන්නේ ඒනිසාය. දැන්ම කියන එක එතරම් සාධාරණ නැතත්, විමල් වීරවංශ මහතා ගේ ඓතිහාසික කාර්යභාරය ද පරණ සුප් එකම බව පැහැදිලිය. තියෙන දෙයක් අලෙවි කරනවා මිස ඔහුට අලුත් දෙයක් කළ නොහැකිය. තමන් ගොඩ නගන්නේ ජ.වි.පෙ.ම දිගුවක් යැයි වීරවංශ මහතා කියන දේ සත්‍ය නම් ඉහත නිගමනය එතරම් අසාධාරණ නැත. මැයි දිනයේදී තමන් ද වීරවංශ මහතා කිව්වා වගේම මහා ජාතික පුළුල් පෙරමුණක් ගොඩ නගනවායැයි කියා සෝමවංශ මහතා කියා සිටියේ, විමල් වීරවංශ මහතා අලුත් දෙයක් නොකර ජ.වි.පෙ. තියෙන දෙයක් සොරා ගනීවියැයි කියා ඇති වූ බිය නිසා විය යුතුය. සමාජවාදී අර්ථ ක්‍රමය හෙවත් රාජ්‍ය ව්‍යවසාය ක්‍රමය කිසි කමකට නැති උත්සාහයක් වුවත් 1977 න් පසු එම ක්‍රමයෙන් නිදහස් වන්නට ගත් උත්සාහයද ගමන් ගත්තේ විකෘති මගකය. විවෘත ආර්ථිකය යන ව්‍යවහාර පදයෙන් හැඳින්වෙන එම උත්සාහය ට බරපතල අභියෝගයක් වූයේ ඊට අවශ්‍ය සමාජ පිළිගැනීම ලබාගැනීමට නොහැකි වීමය. අලුත් ක්‍රමය රටට හඳුන්වාදුන් ආණ්ඩුවද ඊට සමාජ පිලිගැනීමක් ඇතිකිරීමට විශේෂ වෙහෙසක් ගත්තේ නැත. මේ නිසා විවෘත ආර්ථිකය යනු දැඩි ඒකාධිපති නාස්තිකාර දූෂිත පාලනයක ප්‍රකාශණයක් යැයි බොහෝ දෙනා අදත් විශ්වාස කරති. තල් අත්තකට බෙලි ගෙඩියක් වැටීම කරන කොටගෙන වනාන්තරයක් කුලප්පුකළ හාවා මෙන්, හරි හමන් අවබෝධයක් නැතිව ලංකාවේ බුද්ධිමතුන් ද ප්‍රාථමික ජන සමාජය විවෘත ආර්ථිකයට එරෙහිව උසිගැන්වූහ. තමන් කරන්නේ තම රටට එරෙහි අපරාධයක් බව ඔවහු කල්පනා නොකළහ. එ.ජා.ප.ය විසින් ආරම්භ කළ නිසාම මොකක් වුනත් ඊට විරුද්ධවිය යුතුයැයි තීරණය කොට බුද්ධිමය සමාජයේ ප්‍රමුඛයින් ඉවක් බවක් නැතිව ඊට පහර දෙන්නට විය. එදිරවීර සරච්චන්ද්‍ර මහතා විසින් රචනා කළ, දැනුවත් අසත්‍යයන්, ඕපාදූප,

වැරදි තොරතුරු හා වැරදි අර්ථකතන වලින් පිරී ගිය 'ධර්මිෂ්ට සමාජය' නම් ළඳ බොළඳ කෘතිය එහි සංකේතයක් බඳුය. විවෘත ආර්ථික ක්‍රමය හුදෙක් රැකවරණයක් නැති දරුවෙකුමෙන් එසේ රස්තියාදුකාරයින්ගේ ටොකු කෑමට ලක් විය. ඒ නිසා එය අර්ථවත් කරගන්නටවත් එහි ප්‍රතිඵල නෙලා ගන්නටවත් ලංකාවට වාසනාව නැතිවිය. දූෂණය හෝ ඒකාධිපති පාලනය විවෘත ආර්ථිකයේ ප්‍රකාශණයක් නොව ලාංකීය සමාජයේ තාර්කික ප්‍රකාශණයක් බව අදටත් ප්‍රාථමික

ජනසමාජය පමණක් නොව දැන උගත් ද්විතීයික සමාජයේ සමහරුන් ද දන්නේ නැත. සමාජවාදී රාජ්‍ය සමූහය නින්දා සහගත ලෙස දූෂණය වූයේත් අත්තනෝමතික කුරිරු පාලන තන්ත්‍ර බවට පත් වූයේත් ඒ රටවල්වල විවෘත ආර්ථිකයක් ක්‍රියාත්මක වීමෙන් නොවන බව ඔවුහු සොයා නොබැලූහ. එමෙන්ම ආගමික මූලධර්මවාදී රාජ්‍ය බොහොමයක් ම අතිශයින්ම දූෂිත වී ඇත්තේත් කෲර රාජ්‍යයන් බවට පත් වී ඇත්තේත් විවෘත ආර්ථිකයක් නිසා නොවන බව නොසිතූහ. දූෂිත භාවය, අක්‍රමිකතාවය, ඒකාධිපතිභාවය, අත්තනොමතිකත්වය විවෘත ආර්ථිකයට හිතකර දෙවල් නොවේ. ඇත්තෙන්ම සිද්ධවන්නේ ඒ දුෂ්ට ගති වලින් විවෘත ආර්ථික පිලිවෙත දූෂණය වීමය. මිනිස් අයිතිවාසිකම් මෙන්ම ශ්‍රී ලංකාවේදී ව්‍යවසායක නිදහස ද දරුණු ලෙස උල්ලංඝනය වන අයිතිවාසිකමක් වී තිබේ. ලංකාවේ සිද්ධවූයේත් දැන් සිද්ධවන්නේත් එයයි. ව්‍යාපාරිකයා තම වස්තුව ස්වභාවික ආපදාවන්ගෙනුත්, සොරුන්ගෙනුත්, රජුන්ගෙනුත් රැකගත යුතුයැයි කියා බුදුන්වහන්සේ ද පවසා ඇත. දූෂණයට ද වෙනත් මානව ක්‍රියාවන්ට මෙන්ම කිසියම් නියාමයක් නැතුවාම නොවේ. මනුෂ්‍යයින් හොඳ හෝ නරක නොවේ. අවස්ථාවක් ලදොත් සොරකම් කිරීමට හෝ පාපයෙහි ගැලීසිටීමට ඇති කැමැත්ත මනුෂ්‍ය ගතියකි. එ හෙත් එය කෙරෙන්නේ ඊට අනුබල ලැබෙන පරිසරයක් ද, සොරකම් කිරීමට පහසු වස්තුවක් ද, නිදහස් වීමට මාර්ගයක් ද තිබුනෝතින්ය. පොදු දේපොල හෙවත් රාජ්‍ය දේපොල හා අරමුදල් වනාහී සොරකම් කරන්නාට පහසුවෙන් සොරාගත හැකි වස්තුවකි. ආගමික පූජ්‍ය අරමුදල් ද එවැනිම දූෂණයට කැපවූ අරමුදල් වර්ගයක්ය. මහා භාරකාර දෙපාර්තමේන්තුවේ වාර්තා පරීක්ෂා කරන කෙනෙකුට ලංකාවේ උතුම් බෞද්ධ ආයතන මොන තරම් දූෂිත දැයි කියා අවබෝධ කරගත හැකි වනු ඇත. කලින් කලට බලයට පත්වන ආණ්ඩු හා නිලධාරීන් පරිහරණය කරන, රාජ්‍ය දේපොල හා අරමුදල් ගැන සොයාබලන්නට පුද්ගලික දේපොලවලට මෙන් අයිති කරුවෙකු නැත. ඒවා සොයා බලන්නේ නිලධාරි තන්ත්‍රය විසින්මය. එබඳු දේපොල දූෂණය කිරීම හා වංචා කිරීම අපහසු නැත. ආණ්ඩුව හා නිලධාරීන්ද නීති නිලධාරීන් ද එක්සත් වූ කල, එනම් මාෆියාවක් වූ කල දූෂණයට පියාපත් ලැබේ. ඉන්පසු එය කීයටවත් වලක්වාලිය නොහැකිය. ප්‍රමුඛ බැංකු වංචාවත්, වැට් බදු වංචාවත්, මිහින් ලංකා අපරාධයත්, මීට සුලු උදාහරණයක් පමණි. සමාජවාදී රාජ්‍ය සමූහය අන්ත දූෂිත වූයේ රාජ්‍ය කේන්ද්‍රිය දේපොල හා රාජ්‍ය ව්‍යවසායය නිසාය. දූෂණය නිට්ටාවටම

සුවකරගැනීමට යමෙකුට අවශ්‍යනම් ඔහු කළයුත්තේ පොදු අරමුදල්, පොදු දේපොල රාජ්‍ය ව්‍යවසායයන් හැකිතාක් අඩු නවීන ශිෂ්ට සම්පන්න රාජ්‍ය ක්‍රමයක් ගොඩනගා ගැනීමට ක්‍රියා කිරීමය. එසේ නැතිව ශ්‍රේෂ්ඨ විප්ලව මගින් දූෂණය හෝ භීෂණය නැතිකළ නොහැකිය. 1977 න් පසුව බලයට පත් වූ ආණ්ඩුවට ඊට පෙර පැවැති ආණ්ඩුවෙන්
රාජ්‍ය ව්‍යවසායයන් රාශියක් ම දායාද ලෙස ලැබී තිබුණේය. ඊට අමතරව රටේ සංවර්ධනයට අත්‍යවශ්‍ය කොන්දේසියක් ලෙස, මංමාවත් හා විවිධ යටි ව්‍යුහ සංවර්ධන කාර්යයන්ට මැදිහත් වීමට ද සිදුවිය. එය දූෂණය කැමැති කෙනෙකුට පහසුවෙන් ගමන් කළහැකි මාවතක් විය. ඒ නිසා හටගත් දූෂණ්‍ය වූ කලී රජයේ පාරදෘශ්‍යභාවයේ ප්‍රශ්ණයක් මිස විවෘත ආර්ථිකයේ තාර්කික ඵලයක් නොවේ. විශාල රාජ්‍ය ව්‍යවසායන් නිසා විශාල දූෂණ සිදුවිය. රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලික අංශයට පැවරීමේදීත් වන්නේ අර ටිකමය. දැන් සිද්ධවන්නේත් එයමය. එහෙත් ලංකාවේ දේශපාලන සමාජය මෙන්ම එහි ප්‍රකාශකයෝ තමන් සචේතනිකව කරන නොපනත්කම් හා අපචාර අචේතනික ව්‍යවස්ථාවක් හෝ නීතියක් මත පටවති. අපිට කරන්න දෙයක් නෑ ඕවා ජේ ආර් ගේ ව්‍යවස්ථාවේ හැටියැයි කියති. එය 'හරක් හොරෙකු හොරකමේ වරද කඹය වෙත පවරනවා' වැනිය. මෙ හෙයින් රාජ්‍යයක දූෂිත භාවයත් විවෘත ආර්ථිකයත් යනු එකක් නොව දෙකකි. එය එසේ නොවේ නම් හොංකොං, තායිවානය, ද.කොරියාව, මැලේසියාව, තායිලන්තය, සිංගප්පූරුව, ඩුබායි ආදී රටවල් දියුණු වන්නට විදියක් නැත. ඒ රටවල් ලොව ජීවත් වීමට සුදුසු රටවල් කියා කියනවා මිස ලංකාව මෙන් දූෂිත කොම්පොස්ට් වලවල් කියා කවුරුවත් කියන්නේ නැත. ඉතින් අර ඓතිහාසික කාර්යභාරය කරන්නට තතනන මහත්වරුන්ටත් සහෝදරවරුන්ටත් කරන්නට කියා කුමක් නම් තිබේද? මේ වන විට මේ සහෝදරවරුනුත් අනෙකුත් අයත් දැන උගත් ද්විතීයික සමාජයේ බුද්ධිමතුනුත් ළමා පරපුර ඉදිරියේ විහිළුකාරයන් බවට පත්වෙමින් සිටිති. මේ නායක නායිකාවන් බුද්ධිමතුන් රූපවාහිනී තිර මතට පැමිණි කළ ළමෝ උසුළු විසුළු කරති. ඔවුන් දක්වන අදහස් ළමුන් ගේ හාස්‍යයට ලක්වේ. මෙය හොඳ තත්ත්වයක් නොවේ. මේ වනාහී රටේ නායකයන්ගේත් බුද්ධිමය සමාජයේත් චර්යාධාර්මික ආධිපත්‍යයෙන් අනාගත සමාජය වෙන් වෙමින් සිටින බව ප්‍රකාශ වීමකි. එක්තරා ඇහැට නොපෙනෙන අරාජිකත්වයකි. මෙයට හේතුවක් ඇත. එයනම් යෞවනයන් ට හෝ ළමුන් ට මග පෙන්වීමක් මේ අයගෙන් නොලැබෙන නිසාය. යෞවනයන් ද ළමුන්ද ගෝලීය සමාජය ට ඇතුළුවන්නට වෙර දරද්දී ඊට ගරහමින් ඒ වෑයම වැලැක්වීමට වෙර දරන වැඩිහිටි බුද්ධිමය සමාජය හා දේශපාලන සමාජය, රාවණා යුගයට හා බුද්ධ කාලයට යන්නට දරුවන්ට ආරාධනා කරති. ඔවුන් ගරහන්නේ අනාගත සමජයේ සිහිනවලට බව ඔවුහු කල්පනා නො කරති. ජනතා විමුක්ති පෙරමුණ ද තරුණ ව්‍යාපාරයක් යැයි කියා ඔවුන්ම කියා ගත්තත් එය ද යෞවනයන්ගේ ආකර්ශණයෙන් ගිලිහී ඇත. වෙනත් වෙනත් කණ්ඩායම් වල ද තත්ත්වය එයමය. ලෝකයේ ගමනත් සමග යාවත් කාලීන

වීමට ඔවුන්ට නොහැකි වී තිබේ. ඔවුන්ට කිසිදු අලුත් අදහසක් නැතිබව ඔවුන් නව පරපුරට පෙන්වා තිබේ. මේ නිසා
දේශපාලන ව්‍යාපාර හෝ පොදු සමාජ ව්‍යාපාරවලට තරුණ පරපුර ඇතුලුවීම ඇනහිට තිබේ. යෞවනයන් ඔවුන් අතහැර ගොස් තිබේ. සමස්ථ ලෝකයම පසු ගිය දශක කිහිපය තුළ අප පසු කොට බොහෝ දුර ගොස් ඇතත් ලංකාවේ දේශපාලන සමාජයත්, බුද්ධිමය සමාජයත් ඒ සමග ගමන් ගන්නට අසමත් විය. නවීන ව්‍යවයායික ප්‍රවනතා, කළමණාකරන න්‍යාය, ආදී ක්ෂේත්‍රවල සිදු වී ඇති වර්ධනයන් ද අලුතින් දියුණු වී ඇති ව්‍යවසායික විෂයයන් හා උපායයන් ද අපෙන් ඈත් වී බොහෝදුර ගොස්ය. මේ නිසා ලංකාවේ ව්‍යවසායික ප්‍රජාවටද ලෝකය සමග තරගය වදින්නට සිදු වී ඇත්තේ නොදියුණු ආම්පන්න අතැතිව අයහපත් කොන්දේසි යටතේය. ඒ මදිවාට නොදියුණු නිලධාරි පරපෝෂිත සමාජයට යටත්වය. කලක් තිස්සේ පැසවමින් තහවුරු වී ඇති ව්‍යවසාය විරෝධී සංස්කෘතියට යටත්වය. නවීන ලෝකය ව්‍යවසායකත්වයට, නිෂ්පාදනයට හා පරිභෝජනයට මුල්තැනක් දී ක්‍රියා කරන විට ශ්‍රී ලංකාවේ තවමත් ක්‍රියා කරන්නේ 56 විප්ලවීය හැගීමෙනි. මේ නිසා ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ප්‍රජාවද රටේ හැටියට අනුවර්තනය වී දූෂණ යාන්ත්‍රණයේ අවයව බවට පත් වී සිටිති. නැතහොත් පුළු පුළුවන් හැටියට තම මව්බිමෙන් පලායති. දේශපාලන සමාජයත්, බුද්ධිමය සමාජයත් ගෝලීය බිල්ලා සොයමින් ලෝක යථාර්ථය නොදැන, බුර බුරා ඇවිදින විට සමස්ථ ජාතික නිෂ්පාදන ක්‍රියාවලියම බිඳ වැටෙමින් තිබේ. අලුත් ලෝක වර්ධනය ආරම්භ වූයේ ලෝකයේ දියුණු රටවල සමාජයද එක්තරා විප්ලවීය මාරුතයකට හසුකර ගනිමින්ය. එ හෙත් අපට පසුපසින් සිටි ඉන්දියාව පවා ඊට ඇතුලත් වීමට පසුව සමත් විය. මේ නිසා පීඩාවට පත්ව සිටින ලංකාවට ජනතා විමුක්ති පෙරමුණේ දිගුවක් අවශ්‍යවන්නේ නැත. ගැඹුරින් කල්පනා කළහොත් ලංකාවේ පක්ෂවල කාලය දැන් හරිය. වාර්ගික ප්‍රජාතන්ත්‍රවාදය, ව්‍යවසායික නිදහස, රාජ්‍ය කුඩා කිරීම හා නිලධාරීතන්ත්‍ර පීඩනය අහෝසි කිරීම, නිදහස් අධ්‍යාපනය වෙනුවට අධ්‍යාපනයේ නිදහස තහවුරු කිරීම, මිනිස් අයිතිවාසිකම් තහවුරු කිරීම, ගෝලීය සමාජයට විවෘත වීම ඇතුළු නවීන ලෝක ප්‍රමිතීන් රකින්නට අසමත් පක්ෂ එකක්වත් මින් ඉදිරියට ලංකාවේ පාලනයට තබා ලියාපදිංචි කිරීමටවත් සුදුසු නැත. ඉතින් ඒ අයට කරන්නට ඇති ඓතිහාසික කාර්යභාරය කුමක්ද? උතුම් මව්බිම වෙනුවෙන් ඔවුන්ට කළ හැක්කේ තවදුරටත් මාතෘ භූමියට හුනියම් නොකර සිටීමය. නව දේශපාලන පක්ෂයක අවශ්‍යතාවය ඇත්තේත් තිබෙන පක්ෂවලට පැවැත්ම ඇත්තේත් ඉහත යථාර්ථය තේරුම් ගැනීම තුළය.

**--ප්‍රගීත් එක්නැලිගොඩ විසිනි--**